# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1965/30 – 2016 මැයි 05 වැනි බ්‍රහස්පතින්දා – 2016.05.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 75 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/4/2014/LO/241.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ACQ/O/J/D/241.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 අප්‍රේල් මස 18 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, වලිකාමම් බටහිර.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජේ 166 වඩ්ඩු නිරිත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වඩුක්කෝට්ටේ නැගෙනහිර නමැති ගමේ පිහිටි, යාපනය දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක Ya/ CHN/2014/214 හා 2014.11.29 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්: 0.3373 ක් පමණ වන ඉඩම් කැබැල්ලට මායිම්.

01. **කැබලි අක්ෂර ''ඒ'' – අනුප්පු – ප්‍රමාණය: හෙක්. 0.3373 ක් පමණ**

උතුරට: කේ. මරුතපිල්ලෙයි හිමිකම් කියන අනුප්පු කුඹුර ; නැගෙනහිරට: ඇළ; දකුණට: සිවශර්මා කුරුක්කු හිමිකම් කියන අනුප්පු කුඹුර; බටහිරට: අඩිපාර.

05 - 565.



මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.